**පාර්ලිමේන්තු සැසි අංක : 492**

**ආයතනයේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව**

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ **ගරු අමාත්‍යවරයාගේ** නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

**பாராளுமன்ற அமர்வு இலக்கம் : 492**

**நிறுவனத்தின் பெயர் : மாவட்டச் செயலகம், மட்டக்களப்பு.**

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற்கட்டளை இலக்கம் 119(4) இன் கீழ் **கௌரவ அமைச்சரின்** அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

**Parliamentary Publication Series No: 492**

**Name of the Institution: District Secretariat, Batticaloa.**

Submission of observations of **Hon. Minister** and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

පාර්ලිමේන්තුවේ පොදු ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව පිළිබඳව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යාංශයේ නිරීක්ෂණ හා ඒ සම්බන්ධව ලබනු කටයුතු පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු සැසි අංක : 492
දිස්ත්‍රික් ලේකම් ලේකම් කාර්යාලයේ නම : මඩකලපුව

| පොදු ගිණුම් කාරක සභාව විසින් පෙන්වා දුන් අඩුපාඩු හා මගපෙන්වීම | ගණන් දීමේ නිලධාරියා විසින් ලබා ගත් කටයුතු |
|---|---|
| විගණාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතතුරු සපයා නොතිබුණි. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය. | මසක් තුළ සියලුම විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීමට හා පිළිතුරු නොදුන් විගණන විමසුම් අවම කිරීමට අපි ක්‍රියාවලිය අනුගමනය කරමු. |
| හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක හඳුනා ගෙන ක්‍රියාත්මක කරනු ලැබේ. |
| ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | දැනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පරිපාලන කටයුතු 2024.06.10 දින සිට තිරායිමඩුවේ පිහිටි නව දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලට ගෙන ගොස් ජනතාව සඳහා සේවාවන් සපයනු ලැබේ. සේවා ලාභී ප්‍රඥප්තිය පරිගණකගත කර එය ඉදිරිපස සේවා අංශයේ ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි. | සියලුම කාර්ය මණ්ඩලය සඳහා වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ලබා දීම සම්බන්ධව මානව සම්පත් සැලැස්මේ සඳහන් නොවූ නමුත්, වර්තමානයේ පුහුණුව සඳහා අවශ්‍යතාව සියලු සේවකයින්ගෙන් අසා දැනගෙන ඒ අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්ම වෙනස් කර පුහුණු ලබා දෙනු ලැබේ. |
| ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය. | ඉදිරියේ දී යටත්ව මට්ටමේ විගණන මතය පැහැදිලි මතයක් ලෙස ළඟා වීම සඳහා කටයුතු කරමින් පවතී. |
| හඳුනා ගත් කාර්ය දර්ශකයේ ලඟාවීම 24%කට වඩා අඩු ප්‍රමාණයෙන් විය. | හඳුනාගත් කාර්ය සාධන දර්ශක ඉහළම මට්ටමින් සාක්ෂාත් කර ගැනීමට පියවර ගෙන ඇත. |
| දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව අවම වශයෙන් කාර්තුවකට වරක් රැස් වී නොතිබුණි. | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු රැස්වීම් නිසි පරිදි පැවැත්වීම සඳහා කටයුතු කර ඇත. |
| 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත අනුව ආපදා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | 2024 සිට දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ කමිටු රැස්වීම් නිසි පරිදි පවත්වනු ලැබේ. |
| සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි. | වර්තමානයේ පුහුණුව සඳහා අවශ්‍යතාව සියලු සේවකයින්ගෙන් අසා දැනගෙන ඒ අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්ම වෙනස් කර පුහුණු ලබා දෙනු ලැබේ. |
| දිස්ත්‍රික් පරිසර කමිටුව අවම වශයෙන් මාස 02කට වරක් රැස් වී නොතිබුණි. | දිස්ත්‍රික් පරිසර කමිටුව මාස දෙකකට වරක් කැඳවා ක්‍රියාත්මක කරනු ලැබේ. |

දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මඩකලපුව

J.S. ARULRAJ
Government Agent & District Secretary
Batticaloa.

ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මඩකලපුව

Mrs. R. GAYATHIRY
Chief Accountant
for District Secretary
District Secretariat
Batticaloa

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

## ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2026 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි.

මහාචාර්ය ඒ.එච්.එම්.එච්.අබයරත්න (පා.ම.)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය

මහාචාර්ය ඒ.එච්.එම්.එච්. අබයරත්න
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍ය
නිදහස් චතුරශ්‍රය - කොළඹ 07.